# ජාතික ක්‍රීඩා අරමුදල

## මෙහෙවර ප්‍රකාශය

**ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වලට ධෛර්ය දීම , ඒවා දියුණු කිරිම හා සංවර්ධනය කිරිම සඳහා ආධාර සහ අනුබල දීම ජාතික ක්‍රීඩා අරමුදලේ මෙහෙවරයි.**

## දැක්ම

**ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් වර්ධනය කිරිම.**

## නීතිමය පසුබිම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතින් ජාතික ක්‍රීඩා අරමුදල ස්ථාපිත කරනු ලැබීය. පනතට අනුව අරමුදලේ කාර්යයන් සඳහා රජයෙන් ලැබිය හැකි මුදල් විදේශ රටකින් ලැබෙන ආධාර මුදල්, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම පිණිස යම් ආයතනයකින් ලැබෙන මුදල්, යම් තැනැත්තෙකු විසින් පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල්, වෙනයම් මාර්ගයකින් ලැබෙන මුදල් අරමුදලට බැරවිය යුතුය. අමාත්‍යවරයා විසින් නිශ්චය කරණු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම, දියුණු කිරිම හා සංවර්ධනය සඳහාද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්ද, ආයෝජනය කිරිම සඳහාද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරිමේ හෝ බලගැන්විමේ කාර්ය සඳහාද අරමුදලෙන් මුදල් ගෙවිය හැකිය.

# 2015 වර්ෂය සඳහා වාර්ෂික පාලන වාර්තාව

2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

## හඳුන්වාදීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

## ක්‍රීඩාව ගමෙන් ජාත්‍යන්තරයට

අද ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය මුහුණපාන ප්‍රධාන අභියෝග දෙකක් වන්නේ ක්‍රීඩාව ගම් මට්ටමින් ව්‍යාප්ත කිරීම හා ජාත්‍යන්තර ජයග්‍රහණ ලැබීමය. මේ සඳහා දියුණු රටවල් අනුව යමින් සැමට ක්‍රීඩා නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබේ. මෙම වැඩසටහන ග්‍රාම සේවා මට්ටම,ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම, දිස්ත්‍රික් හා පළාත් මට්ටම හරහා ජාතික මට්ටමට දිවෙයි. ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටම දක්වා දිවෙන වැඩසටහන් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙයි.

ඉහතින් සඳහන් කල දීප ව්‍යාප්ත ක්‍රීඩා වැඩසටහන් සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන මෙන්ම ක්‍රීඩා අරමුදලේ මුදල්ද යොදාගන්නා ලදී.

ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් නඟා සිටුවීම අවශ්‍ය කරුණක්වන අතර ඒ වෙනුවෙන් ගරු අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ ක්‍රීඩා සංවර්ධන අරමුදලේ දායකත්වයට ඉමහත්

පිටුවහලක්ව ඇත.2015 වර්ෂයේදී ක්‍රීඩක ක්‍රීකාවන්ට පෝෂණ දීමනාව ලබා දීම, උපහාර පිදීම,වෛද්‍යාධාර දීම, සහ ආර්ථික අපහසුතාවලින් පෙළෙන ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලී සිටින පුද්ගල සංවර්ධනය වැනි මානුෂීය කරුණු සඳහා මෙම අරමුදලින් ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. 1973 දී පිහිටවු ජාතික ක්‍රීඩා අරමුදල අද මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රය පෝෂණය කරන දැවැන්ත ව්‍යාපෘතියක් බවට පත්ව ඇත්තේය.

## ක්‍රීඩා සම්මේලන සඳහා ලබා දුන් මුදල්

විවිධ ක්‍රීඩා ඉසව් නියෝජනය කරනු ලබන ක්‍රීඩා සම්මේලන වලට ප්‍රතිපාදන මුදාහැරීමට ක්‍රියා කිරිම මගින් 2015 වර්ෂය තුල ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරග රැසකට ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි කරවන ලදී. ක්‍රීඩා සම්මේලන වල ඉල්ලීම් සලකා අරමුදලෙන් ලබා දෙන ලද මුදල් ප්‍රමාණයන් පහත දක්වා ඇත.

| අනු අංකය | ක්‍රීඩා සම්මේලන | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා කරාතේ දෝ සංගමය | 76,000.00 |
| 2. | නුවර එළිය දිස්ත්‍රික් මේස පන්දු සම්මේලනය | 40,000.00 |
| 3. | ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය | 40,000.00 |
| 4. | කැරම් සම්මේලනය | 240,000.00 |
| 5. | ශ්‍රී ලංකා රුවල් ඔරු සම්මේලනය | 1,500,000.00 |
| 6. | ශ්‍රී ලංකා පාසල් නෙට්බෝල් සංගමය | 470,800.00 |
| 7. | ශ්‍රී ලංකා පාසල් මළල ක්‍රීඩා සංගමය | 296,000.00 |
| 8. | ශ්‍රී ලංකා බෝල්රූම් ඩාන්ස් සංගමය | 150,000.00 |
| | **එකතුව** | **2,812,800.00** |

## ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ක්‍රීඩකයින් සඳහා පෝෂණ දීමනා (දැනට ක්‍රීඩා කරන) | 3,657,000.00 |
| 2. | වතු ආශ්‍රිත ක්‍රීඩා කටයුතු සඳහා දීමනා | 30,000.00 |
| 3. | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | 650,000.00 |
| | **එකතුව** | **4,337,000.00** |

## පුහුණුකරුවන්ට වෛද්‍යවරුන්ට හා නිලධාරින්ට මුදල් ආධාර

ක්‍රීඩාවේ උන්නතිය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දායකත්වයක් මෙන්ම පුහුණු කරුවන්ගේ හා නිලධාරින්ගේ කැපවීම අවශ්‍යතාවය හඳුනාගෙන එම පාර්ශවයන් සඳහා මුදල් ආධාර ලබා දීමට ජාතික ක්‍රීඩා අරමුදලේ සම්පත් යොදා ගන්නා ලදි. ඒ අනුව පුහුණු කරුවන්ට වෛද්‍යවරුන්ට හා නිලධාරින්ට දිමනා වශයෙන් මුදල් අධාරත් විදේශ ගමන් සඳහා ගුවන් ටිකට්පත් ඇතුළු මුදල් ආධාර ලබා දීමත් සිදු කරන ලදී. විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | ශක්ති වර්ධන ශාලාවේ උපදේශක දීමනා | 39,913.97 |
| 2 | නිලධාරින්ගේ විදේශ සංචාර | 1,952,230.81 |
| | **එකතුව** | **1,992,144.78** |

## ක්‍රීඩා තරග වෙනුවෙන් මුදල් අධාර ලබා දීම

2015 වර්ෂයේදි ශ්‍රී ලංකාව තුල පවත්වන ලද ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා වූ ජාතික ක්‍රීඩා අරමුදලේ දායකත්වය පහත දක්වා ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ජාතික මහ ක්‍රීඩා උළෙල ගෙවීම් | 5,088,500.00 |
| 2. | ජාත්‍යන්තර තරඟ | 228,792.00 |
| | | |
| | **එකතුව** | **5,317,292.00** |

## පිළිගැනීම් සහ උපහාර

ජාතික හා ජාත්‍යන්තර තරග වලදි විශේෂ දක්ෂතා පෙන්වා රටට කිර්තියක් ලබා දී දැනට විශ්‍රාම සුවයෙන් සිටින හා දැනටත් ක්‍රීඩාවේ සක්‍රීනව සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් උපහාර පිදිම හා විශිෂ්ඨ ජයග්‍රහණ ලබා මවු බිමට පැමිනෙන අවස්ථා වලදී ගෞරවාන්විත

පිළිගැනිම ක් ලබා දීම සඳහාක් පියවර රැසක් ගැනීමට 2015 වර්ෂය තුලදී ක්‍රියා කරන ලදි. ඒ සඳහා ලබා දුන් මුදල් හා දරන ලද වියදම් පහත දක්වා ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | ක්‍රීඩකයින් සදහා උපහාර | 18,543,750.00 |
| | **එකතුව** | **18,543,750.00** |

## වෙනත් වියදම්

2015 වර්ෂය තුල ජාතික ක්‍රීඩා අරමුදලින් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අනුමැතිය මත දරන ලද අනෙකුත් වියදම් විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | විවිධ වියදම් | 11,630,150.00 |
| 2 | පරිපාලන වියදම් | 219,000.00 |
| 3 | ජාතික ක්‍රීඩා සභාව | 184,000.00 |
| 4 | වෙනත් දීමනා | 1,080,814.00 |
| 5 | විගණන ගාස්තු | 167,166.00 |
| 6 | ආයෝජන | 15,000,000.00 |
| | **එකතුව** | **28,281,130.00** |

## 2015 වර්ෂය තුල ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා

ශ්‍රී ලංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තරග වලදී ලබාගත් පදක්කම් පිළිබඳ සටහනක් පහත දක්වමි. මෙම දක්ෂතා ප්‍රදර්ශනය කිරිම සඳහා ජාතික ක්‍රීඩා අරමුදලෙන් විශේෂිත දායකත්වයක් ලබා දීමට හැකි විය.

| තරගාවලිය | ක්‍රීඩාව | රන් | රිදී | ලෝකඩ | එකතුව |
|---|---|---|---|---|---|
| | | | | | |
| ආසියානු යොවුන් මළල ක්‍රීඩා - කටාර් | මීටර් 400 බාධක දිවීම - කාන්තා | 1 | 0 | 0 | 1 |
| | මීටර් 400 බාධක දිවීම - පිරිමි | 0 | 1 | 0 | 1 |
| | තුන් පිම්ම | 0 | 1 | 0 | 1 |
| | උස පැනීම | 0 | 1 | 0 | 1 |
| | මීටර් 400 සහය දිවීම | 1 | 0 | 0 | 1 |
| දෝහා විවෘත අන්තර්ජාතික බොක්ෂිං තරගාවලිය - කටාර් | කි.ග්‍රෑ. 91 ට වැඩි සුපර් හෙවි බර පන්තිය | 0 | 1 | 0 | 1 |
| | කි.ග්‍රෑ. 69 ට වෙල්ටර් බර පන්තිය - පිරිමි | 0 | 0 | 1 | 1 |
| | කි.ග්‍රෑ. 81 ට ලයිට් හෙවි බර පන්තිය | 0 | 0 | 1 | 1 |
| ආසියානු ග්‍රෑන්ඩ් ප්‍රික්ස් - බැන්කොක් | මීටර් 800 (ගැහැණු) | 3 | 3 | 0 | 6 |
| | 4*100 මීටර් | 0 | 1 | 1 | 2 |
| | මීටර් 100 | 0 | 0 | 1 | 1 |
| | උස පැනීම | 0 | 0 | 1 | 1 |
| | හෙල්ල විසි කිරීම | 0 | 0 | 1 | 1 |
| | මීටර් 800 (පිරිමි) | 0 | 1 | 0 | 1 |
| 21 වෙනි ආසියානු මළල ක්‍රීඩා ශූරතාවලිය - වුහන් | මීටර් 800 (ගැහැණු) | 0 | 0 | 1 | 1 |
| තායිලන්ත විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | මීටර් 1500 | 1 | 0 | 0 | 1 |
| | මීටර් 300 බාධක | 1 | 0 | 0 | 1 |
| | හෙල්ල විසි කිරීම | 1 | 0 | 0 | 1 |
| | මීටර් 1500 | 1 | 0 | 0 | 1 |
| | මීටර් 400 | 0 | 1 | 0 | 1 |
| | දුර පැනීම | 0 | 0 | 1 | 1 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන් ක්‍රීඩා උළෙල - සැමෝවා | බර ඉසිලීම | 0 | 2 | 1 | 3 |
| | උස පැනීම | 0 | 1 | 0 | 1 |
| | මීටර් 400 කඩුලු පැනීම | 0 | 1 | 0 | 1 |
| | ස්කොෂ් | 0 | 0 | 1 | 1 |
| 8 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය කරාතේ තරඟාවලිය - ඉන්දියාව | කරාතේ | 9 | 13 | 26 | 48 |
| තායිලන්ත කණිෂ්ට මළල ක්‍රීඩා තරඟාවලිය | මීටර් 100 (පිරිමි) | 1 | 0 | 0 | 1 |
| | දුර පැනීම | 1 | 0 | 0 | 1 |
| | මීටර් 400 | 1 | 0 | 0 | 1 |
| | තුන් පිම්ම | 1 | 0 | 0 | 1 |
| | කඩුලු පැනීම | 1 | 1 | 0 | 2 |
| | 4*100 සහය දිවීම | 0 | 1 | 0 | 1 |
| | මීටර් 100 (ගැහැණු) | 0 | 0 | 1 | 1 |
| | මීටර් 200 | 0 | 0 | 1 | 1 |
| | මීටර් 400 (පිරිමි) | 0 | 0 | 1 | 1 |
| 25 වෙනි ජාත්‍යන්තර විවෘත කරාතේ තරඟාවලිය - ඉන්දියාව | කරාතේ | 13 | 7 | 2 | 22 |
| ආසියානු ශූරතා පාසල් මළල ක්‍රීඩා තරඟාවලිය - චීනය | මීටර් 400 (පිරිමි) | 1 | 0 | 0 | 1 |
| | මීටර් 300 කඩුලු (පිරිමි) | 1 | 0 | 0 | 1 |
| | තුන්පිම්ම (පිරිමි) | 1 | 0 | 0 | 1 |
| | උස පැනීම (ගැහැණු) | 1 | 0 | 0 | 1 |
| | මීටර් 300 කඩුලු පැනීම (ගැහැණු) | 1 | 0 | 0 | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ ශූරතාවලිය - මැලේසියාව | බර ඉසිලීම | 1 | 1 | 1 | 3 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල - ග්ලාස්ගෝ | බර ඉසිලීම | 0 | 1 | 0 | 1 |
| මලයාසියානු විවෘත මළල ක්‍රීඩා ශූරතාවලිය | මළල ක්‍රීඩා | 3 | 0 | 0 | 3 |
| **එකතුව** | | **45** | **38** | **42** | **125** |

## කෘතඥතාව

ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු කරගෙන යාමේදී ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ,ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරින්ගේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ සහභාගිත්වය ඉතා අගය කොට සලකමි.

එච්.ටී.කමල් පත්මසිරි

ලේකම්

පළාත් සභා,පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම

| 2014 ලැබීම් රු. ශත | කොඩ් අංක 1 | කොඩ් අංක 2 | කොඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ලැබීම් 2015 රු. ශත | ලැබීම් 2015 රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| 3,959,363.97 | | | | ජනවාරි 01 දිනට ශේෂය | | | 7,314,386.24 |
| 13,791,631.35 | 011 | 000 | 00 | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | | |
| 1,630,320.55 | 020 | 000 | 00 | ස්ථාවර තැන්පතු පොළී | | 1,718,916.96 | |
| 2,600,000.00 | 034 | 000 | 00 | අනුග්‍රාහක ලැබීම් | | | |
| 39,200,000.00 | 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | | 27,000,000.00 | |
| 1,270,191.79 | 042 | 002 | 00 | විවිධ ලැබීම් - ශක්ති වර්ධන ශාලාවේ ලැබීම් | 09 | 805,441.44 | |
| 15,000,000.00 | 001 | 000 | 00 | ප්‍රදාන | | 30,000,000.00 | |
| 4,108,565.60 | 060 | 000 | 00 | විවිධ තැන්පත් | | | |
| 825,000.00 | 064 | 000 | 00 | වැය ශීර්ෂ වලට බැර | 02 | 97,900.00 | |
| 341,921.00 | 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | 261,947.00 | |
| 15,500,000.00 | 028 | 004 | 00 | විශේෂ අත්තිකාරම් | 10 | | |
| | | | | වෙනත් | | 200,000.00 | |
| | | | | | | | 60,084,205.40 |
| 98,226,994.26 | | | | ලැබීම් එකතුව | | | 67,398,591.64 |
| **2015 ගෙවීම්** | | | | | | **2015 ගෙවීම්** | **2015 ගෙවීම්** |
| 15,000,000.00 | 011 | 000 | 00 | ආයෝජන ගිණුම | | 15,000,000.00 | |
| 5,119,838.40 | 018 | 000 | 00 | විවිධ ණය හිමියෝ | | | |
| 4,066,821.96 | 021 | 000 | 00 | ජාත්‍යන්තර තරග | | 228,792.00 | |
| 2,523,720.00 | 023 | 000 | 00 | ක්‍රීඩා තරඟ සඳහා මුදල් | | | |
| 177,000.00 | 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 219,000.00 | |
| 642,217.00 | 027 | 002 | 00 | වෙනත් දීමනා | | 1,080,814.00 | |
| 307,032.26 | 027 | 003 | 00 | ශක්ති වර්ධන ශාලාවේ උපදේශක දීමනා | | 39,913.97 | |
| 10,500,000.00 | 028 | 000 | 00 | විශේෂ අත්තිකාරම් | | | |
| | 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 650,000.00 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 489,500.00 | 029 | 000 | 00 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | | | |
| 1,789,197.00 | 030 | 000 | 00 | නිලධාරීන්ගේ විදේශ සංචාර | | 1,952,230.81 | |
| 1,577,000.00 | 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 3,657,000.00 | |
| 43,000.00 | 037 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | | |
| 17,168,000.00 | 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 18,543,750.00 | |
| 5,405,000.00 | 040 | 001 | 00 | ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය | | | |
| 88,862.00 | 040 | 006 | 00 | ශ්‍රී ලංකා බාස්කට් බෝල් සංගමය | | | |
| 100,000.00 | 040 | 007 | 00 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | | | |
| 100,000.00 | 040 | 028 | 00 | මධ්‍යම පළාත් ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා සංගමය | | | |
| 500,000.00 | 040 | 032 | 00 | ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත වූවන්ගේ ක්‍රිකට් සංගමය | | | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් කරාතේ දෝ සංගමය | | 76,000.00 | |
| 227,500.00 | 040 | 036 | 00 | මාතර දිස්ත්‍රික් | | | |
| | 040 | 035 | 00 | නුවරඑළිය දිස්ත්‍රික් මේස පන්දු සම්මේලනය | | 40,000.00 | |
| 200,000.00 | 040 | 045 | 00 | ක්‍රීඩා සංසඳ | | | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය | | 40,000.00 | |
| | 040 | 035 | 00 | කැරම් සම්මේලනය | | 240,000.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය | | 1,500,000.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් නෙට්බෝල් සංගමය | | 470,800.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් මළල ක්‍රීඩා සංගමය | | 296,000.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා බෝල්රුම්ඩාන්ස් සංගමය | | 150,000.00 | |
| 1,571,940.00 | 040 | 035 | 00 | ක්‍රීඩා සමාජ | | | |
| 300,000.00 | 040 | 042 | 00 | ක්‍රීඩා පදනම | | | |
| | 040 | 043 | 00 | ශ්‍රී ලංකා පාපන්දු සංගමය | | | |
| 1,500,000.00 | 040 | 048 | 00 | ශ්‍රී ලංකා ඇමෙචර් බොක්ෂින් සංගමය | | | |
| 600,000.00 | 042 | 004 | 00 | කැන්ඩි දිස්ත්‍රික් මේස පන්දු සංගමය | | | |
| | 040 | 035 | 00 | විගණන ගාස්තු ගෙවීම | | 167,166.00 | |
| 5,691,500.00 | 043 | 000 | 00 | ජාතික මහ ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 5,088,500.00 | |
| 15,002,479.40 | 047 | 000 | 00 | විවිධ වියදම් | | 11,630,150.00 | |
| 135,000.00 | 047 | 002 | 00 | දීමනා - වතු ආශ්‍රිත ක්‍රීඩා සඳහා | | 30,000.00 | |
| 87,000.00 | 052 | 000 | 00 | ජාතික ක්‍රීඩා සභාව | | 184,000.00 | |
| 90,912,608.02 | | | | එකතුව | | | 61,284,116.78 |
| 7,314,386.24 | | | | දෙසැම්බර් **31** දිනට මුදල් ශේෂය | | | 6,114,474.86 |

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම

| කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තර | ගිණුම් | හර | බැර |
|---|---|---|---|---|---|---|
| | | | | සටහන් | රු.ශත | රු.ශත |
| 002 | 000 | 00 | සමුච්චිත අරමුදල 2015.01.01 දිනට | | | 186,366,953.40 |
| 011 | 000 | 00 | ආයෝජන ගිණුම 2015.12.31 දිනට | | 192,430,862.08 | |
| 013 | 000 | 00 | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලි 2015.12.31 දිනට | 04 | 2,887,862.29 | |
| 013 | 001 | 00 | ලැබිය යුතු wht 2015.12.31 දිනට | 07 | 48,823.30 | |
| 017 | 000 | 00 | ලැබිය යුතු ආදායම්- ජාතික ලොතැරැයි මණ්ඩලය | 05 | 24,098,920.00 | |
| 017 | 001 | 00 | ලැබිය යුතු ආදායම්-ශක්ති වර්ධන ශාලාවේ | | - | |
| 020 | 000 | 00 | ස්ථාවර තැන්පත් ආයෝජන පොලි | 03 | | 10,890,377.97 |
| 021 | 000 | 00 | ජාත්‍යන්තර තරඟ | | 228,792.00 | |
| 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 219,000.00 | |
| 027 | 003 | 00 | ශක්ති වර්ධන ශාලාවේ උපදේශන දීමනා | | | |
| 027 | 002 | 00 | වෙනත් දීමනා | | 1,007,040.00 | |
| 029 | 000 | 00 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | | | |
| 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 3,657,000.00 | |
| 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 18,543,750.00 | - |
| 028 | 000 | 00 | විශේෂ අත්තිකාරම් | | | |
| 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 650,000.00 | |
| 018 | 000 | 00 | විවිධ ණය හිමියෝ | 06 | | - |
| 030 | 000 | 00 | නිලධාරින්ගේ විදේශ සංචාර | | 1,952,230.81 | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් කරාතේ දෝ සංගමය | | 76,000.00 | |
| 040 | 035 | 00 | නුවරඑළිය දිස්ත්‍රික් මේස පන්දු සම්මේලනය | | 40,000.00 | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය | | | |
| 040 | 035 | 00 | කැරම් සම්මේලනය | | 240,000.00 | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය | | 1,500,000.00 | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් නෙට්බෝල් සංගමය | | 470,800.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් මළල ක්‍රීඩා සංගමය | | 296,000.00 | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා බෝල්රූම්ඩාන්ස් සංගමය | | 150,000.00 | |
| 040 | 049 | 00 | ශ්‍රී ලංකා කායවර්ධන සංගමය | | | |
| 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 05 | | 38,470,090.00 |
| 042 | 003 | 00 | ශක්ති වර්ධන ශාලාවේ ලැබීම් | | | 394,571.75 |
| 043 | 000 | 00 | විගණන ගාස්තු ගෙවීම | | 167,166.00 | |
| 046 | 005 | 00 | ජාතික ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 5,088,500.00 | |
| 047 | 000 | 00 | විවිධ ගෙවීම් | | 11,494,900.00 | |
| 047 | 002 | 00 | වතු ක්‍රීඩා කටයුතු දීමනා | | | |
| 047 | 003 | 00 | ශක්ති වර්ධන ශාලාවේ අනෙකුත් වැය | | | |
| 050 | 000 | 00 | මුදල් ශේෂය | | 6,114,474.86 | |
| 052 | 000 | 00 | ජාතික ක්‍රීඩා සභාව | | 165,100.00 | |
| 053 | 001 | 00 | පුහුණු පාඨමාලා -ජ්‍යෙෂ්ඨ පුහුණු සංචිතයේ ගෙවීම් | | | |
| 057 | 000 | 00 | ආබාධ සහිත වූවන්ගේ ක්‍රීඩා පිළිබඳ ජාතික සම්මේලනය | | | |
| 060 | 000 | 00 | විවිධ තැන්පතු | 08 | | 4,943,281.22 |
| 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | | 261,947.00 |
| 001 | 000 | 00 | ප්‍රදාන | | | 30,000,000.00 |
| | | | වෙනත් | | | 200,000.00 |
| | | | | | 271,527,221.34 | 271,527,221.34 |

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සදහා ආදායම් සහ වියදම් ගිණුම

| ආදායම 2014 රු.ශත | කොඩ් අංක 1 | කොඩ් අංක 2 | කොඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ආදායම් 2015 රු. ශත | ආදායම 2015 රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| 12,406,835.55 | 020 | 000 | 00 | ආයෝජන මත පොලි | 03 | 10,890,377.97 | |
| 2,600,000.00 | 034 | 000 | 00 | අනුග්‍රාහත ලැබීම් | | | |
| 42,739,380.00 | 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 05 | 38,470,090.00 | |
| 1,681,061.48 | 042 | 002 | 00 | ශක්ති වර්ධන ශාලාවේ ලැබීම් | | 394,571.75 | |
| | 042 | 003 | 00 | විවිධ ලැබීම් | | 200,000.00 | |
| | 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | 261,947.00 | |
| 15,000,000.00 | 001 | 000 | 00 | ප්‍රදාන | | 30,000,000.00 | |
| | 060 | 000 | 00 | විවිධ තැන්පතු | 07 | 4,943,281.22 | |
| 74,427,277.03 | | | | මුළු ආදායම | | | 85,160,267.94 |
| | | | | | | | |
| | | | | වියදම් | | | |
| 2,523,720.00 | 023 | 000 | 00 | දේශීය තරග සදහා මුදල් | | | |
| 0.00 | 024 | 000 | 00 | වෛද්‍ය දීමනා | | | |
| 177,000.00 | 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 219,000.00 | |
| 346,946.23 | 027 | 003 | 00 | ශක්ති වර්ධන ශාලාවේ උපදේශක දීමනා | | | |
| | 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 650,000.00 | |
| 489,500.00 | 029 | 000 | 00 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | | | |
| 1,789,197.00 | 030 | 000 | 00 | නිලධාරින්ගේ විදේශ සංචාර | | 1,952,230.81 | |
| 1,577,000.00 | 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 3,657,000.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් කරාතේ දෝ සංගමය | | 76,000.00 | |
| | 040 | 035 | 00 | නුවරඑළිය දිස්ත්‍රික් මේස පන්දු සම්මේලනය | | 40,000.00 | |
| | 040 | 035 | 00 | කැරම් සම්මේලනය | | 240,000.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය | | 1,500,000.00 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් නෙට්බෝල් සංගමය | | 470,800.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් මළල ක්‍රීඩා සංගමය | | 296,000.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා බෝල්රූම්ඩාන්ස් සංගමය | | 150,000.00 | |
| 43,000.00 | 037 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | | |
| 16,543,000.00 | 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 18,543,750.00 | |
| 5,174,224.00 | 040 | 001 | 00 | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය | | | |
| 88,862.00 | 040 | 006 | 00 | ශ්‍රී ලංකා බාස්කට් බෝල සංගමය | | | |
| 100,000.00 | 040 | 008 | 00 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | | | |
| | 040 | 032 | 00 | ශ්‍රී ලංකා බිලියඩ් හා ස්නූකර් සංගමය | | | |
| | 040 | 036 | 00 | ශ්‍රී ලංකා කායවර්ධන සංගමය | | | |
| | 040 | 010 | 00 | ශ්‍රී ලංකා ජුඩෝ සංගමය | | | |
| | 047 | 001 | 00 | ශ්‍රී ලංකා ක්‍රිකට් විකාශන පරීක්ෂණ කමිටුවේ දීමනා | | | |
| 1,571,940.00 | 040 | 035 | 00 | ක්‍රීඩා සමාජ | | | |
| 4,066,821.96 | 021 | 000 | 00 | ජාත්‍යන්තර තරග | | 228,792.00 | |
| 300,000.00 | 040 | 042 | 00 | EW ක්‍රීඩා පදනම | | | |
| 100,000.00 | 040 | 028 | 00 | මධ්‍යම පළාත් ප්‍රවීනයින්ගේ මළල ක්‍රීඩා සංගමය | | | |
| | 040 | 048 | 00 | ශ්‍රී ලංකා හෝකි සංගමය | | | |
| | 042 | 002 | 00 | සාර්ක් කාර්යාලයේ දීමනා | | | |
| | 040 | 043 | 00 | ශ්‍රී ලංකා පාපන්දු සංගමය | | | |
| 227,500.00 | 043 | 000 | 00 | විගණන ගාස්තු ගෙවීම | | 167,166.00 | |
| 5,691,500.00 | 046 | 004 | 00 | ජාතික ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 5,088,500.00 | |
| 14,976,584.40 | 047 | 000 | 00 | විවිධ ගෙවීම් | | 11,494,900.00 | |
| 165,000.00 | 047 | 002 | 00 | වතු ක්‍රීඩා කටයුතු දීමනා | | | |
| 715,991.00 | 027 | 002 | 00 | වෙනත් දීමනා | | 1,007,040.00 | |
| 98,000.00 | 052 | 000 | 00 | ජාතික ක්‍රීඩා සභාව | | 165,100.00 | |
| 600,000.00 | 040 | 004 | 00 | කැන්ඩි දිස්ත්‍රික් මේස පන්දු සංගමය | | | |
| 500,000.00 | 040 | 032 | 00 | ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත වුවන්ගේ ක්‍රිකට් සංගමය | | | |
| 1,500,000.00 | 040 | 048 | 00 | ශ්‍රී ලංකාඇමේචර් බොක්ෂින් සංගමය | | | |
| 59,365,786.59 | | | | මුළු වියදම | | | 45,946,278.81 |
| 15,061,490.44 | | | | අතිරික්තය | | | 39,213,989.13 |

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2015.12.31 දිනට ශේෂ පත්‍රය

| කොඩ් අංක 1 | කොඩ් අංක 2 | කොඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | 2014 රු. ශත | 2015 රු. ශත |
|---|---|---|---|---|---|---|
| | | | වත්කම් | - | | |
| 050 | 000 | 00 | මුදල් ශේෂය | | 7,314,386.24 | 6,114,474.86 |
| | | | ලැබිය යුතු විශේෂ අත්තිකාරම් | 08 | | - |
| | | | විවිධ ණය ගැතියෝ | 02 | 14,947,494.90 | 27,035,605.59 |
| | | | | | 22,261,881.14 | 33,150,080.45 |
| | | | ජංගම නොවන වත්කම් | - | | |
| | | | ආයෝජන ගිණුම | | 169,288,291.45 | 192,430,862.08 |
| | | | මුළු වත්කම් | | 191,550,172.59 | 225,580,942.53 |
| | | | බැරකම් | - | | |
| | | | ජංගම බැරකම් | - | | |
| 060 | 000 | 00 | විවිධ තැන්පත් | 07 | 4,943,281.22 | - |
| 018 | 000 | 00 | විවිධ ණය හිමියෝ | 06 | 239,937.97 | |
| | | | | | 5,183,219.19 | - |
| | | | ජංගම නොවන බැරකම් | - | | |
| | | | මුළු බැරකම් | | 5,183,219.19 | - |
| | | | ශුද්ධ වත්කම් | | 186,366,953.40 | 225,580,942.53 |
| | | | ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| 002 | 000 | 00 | සමුච්චිත අරමුදල | | 171,305,462.96 | 186,366,953.40 |
| | | | පෙර වර්ෂ වල ගැලපීම් | | - | 1,000,000.00 |
| | | | | | 171,305,462.96 | 187,366,953.40 |
| | | | ආදායම් හා වියදම් අතර වෙනස (අතිරික්තය) | | 15,061,490.44 | 39,213,989.13 |
| | | | | | | |
| | | | මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | 186,366,953.40 | 226,580,942.53 |
| | | | | | | |

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதியின் திணைக்களம்**
**Auditor General's Department**

**සීඒඑස්/ඒ/එන්එස්එෆ්/02/15එෆ්ඒ** **2017 මැයි 31**

**ලේකම්**
**ක්‍රීඩා අමාත්‍යාංශය**

**ජාතික ක්‍රීඩා අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික ක්‍රීඩා අරමුදලේ 2015 දෙසැමබර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම සහ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවවස්ථවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.2 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූලය ප්‍රකාශළ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශතාවන්ට අනුකූලවන බවට සහ මූලය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදි, අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරෙණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරනය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගනන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

---------------

## 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

2015 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදි ගෙවන ලද රු.167,166 ක් වූ විගණන ගාස්තු අදාල වර්ෂයේදි උපචිත නොකිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීම සිදු කර නොතිබුණි.

### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ආයෝජන ගිණුමේ සහ ආයෝජන පොළි ගිණුමේ ශේෂයන් එදිනට සනාථ කිරීමේ ලිපි සමඟ සැසඳීමේදි එකතුව 35,510 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමාණකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය ප්‍රකාරව ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම් විසින් පිළියෙල කල යුතු වුවත්, මෙම වගන්තිය ප්‍රකාරව පරිපාලන වාර්තාවක් පිළියෙල කැ නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.39,213,989 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,061,490 ක අතිරික්තයක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 24,152,499 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.15,000,000 කින් ඉහල යාම සහ මුළු වියදම රු.13,419,508 කින් පහල යාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කළමණාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රීඩා අමාත්‍යවරයා විසින් පත් කරන ලද පසුගිය වසර 05 තුල දූෂණ අක්‍රමිකතා සොයා බැලීමේ කමිටුවට සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දූෂණ හා වංචා සම්බන්ධව සොයා බැලීමේ කමිටුවට සමාලෝචිත වර්ෂයේදි අරමුදල මඟින් එකතුව රු.2,270,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාල කමිටු වාර්තා මඟින් ලබාදී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අරමුදල මඟින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි ක්‍රීඩා අමාත්‍යාංශයේ නඩත්තු භාර ඉංජිනේරුවරයාට හා ක්‍රීඩා අමාත්‍යාංශයේ පිළිගැනීමේ නිලධාරිණියට පිළිවෙලින් රු. 258,000 ක් හා රු. 128,284 ක් ක්‍රීඩා අරමුදලින් ගෙවා තිබුණි. මෙම වියදම් ක්‍රීඩා අරමුදල පවත්වා ගෙනයාමේ වියදම් නොවන අතර, අමාත්‍යාංශයේ පරිපාලන වියදම් වේ. මෙම ගෙවීම ක්‍රීඩා අරමුදලේ අරමුණුවලට පටහැනි බව නිරීක්ෂනය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 5.1 ක්‍රියාකාරි සැලැස්ම

--------------------

2015 පෙබරවාරි 17 දිනැති අංක 2015/01 දරන මුදල් චක්‍රලේඛයේ 5 වන ඡේදයේ 2 වන වගන්තියට අදාලව ශ්‍රීලංකාවේ ක්‍රීඩාවලට ධෛර්යය දීම දියුණු කිරීම හා සංවර්ධනය කිරීම යන

අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම ඉලක්ක කර ගත් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු විගණනය කිරීම සඳහා අභ්‍යන්තර විගනන ඒකකයක් පිහිටුවා නොතිබු අතර ක්‍රීඩා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකක මගින්ද සමාලෝචිත වර්ෂයේදි අරමුදලට අදාලව විගණනයක් සිදුකර නොතිබුණි. මෙම හේතුවෙන් අරමුදල් පරිපාලනය හා වියදම් සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර පරික්ෂාවක් සිදු නොවන බව නිරීක්ෂණය කෙරේ.

## 5.3 අභ්‍යන්තර විගණනය

----------------------

ජාතික ක්‍රීඩා අරමුදලේ සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම හා තත්‍ය වියදම සැසඳීමේදි වැය විෂයන් 20 ක් අතුරින් අයිතම 17 ක සියයට 34 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

------------------------------

ජාතික ක්‍රීඩා අරමුදලේ 2013 හා 2015 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදි නිරීක්ෂණය නොවු පද්ධති හා පාලන අඩුපාඩු ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| ------------------------- | -------------- |
| (අ) අයවැය පාලනය | අයවැයගත වියදම් හා සත්‍ය වියදම් අතර විචලනයක් පැවතීම |
| (ආ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබීම |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති